# විසිවන සියවසේදී ලංකාවේ නිදහස් සටන් ව්‍යාපාරය තුළ වූ ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග

ඩබ්ලිව්.එම්.එච්. මධුසංක*

**සංක්ෂේපය**

නිදහස යනු කුමක්දැයි හඳුන්වාදීමට ස්ථිර නිර්වචනයක් අදද බිහි වී නැත. මන්ද එය විග්‍රහ කිරීමට හෝ අර්ථ දැක්වීමට ද අසීමිත වූ නිදහසක් ඇති බැවිනි. සරලවම දක්වන්නේ නම් කිසිවකුට යටත් නොවී සිටීම නම් නිදහසයි. කිසිවෙකුගේ බලපෑමකින් තොරව තම අයිතිවාසිකම් භුක්ති විඳීමට හැකියාව ලැබෙන්නේද එතැන ඇත්තේ නිදහසයි. ලොව ඕනෑම තැනක ඕනෑම අන්දමේ බලවතෙක් සිටිය හැකි නමුත් අන් ජාතියක් හෝ ප්‍රදේශයක් හෝ පුද්ගල කණ්ඩායමක් යටත් කරගෙන හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් හෝ නිදහසට බාධාවන අන්දමේ හැසිරීමක් ගෙන යාමට අද කිසිම ජාතියකට වරම් නැත. නමුත් අන්තර්ජාතික නීතියක් හෝ අන්තර්ජාතික සංවිධාන හෝ කිසිවක් නැති කල මේ සියල්ල අධිරාජ්‍යවාදීන්ගේ කැමැත්තෙන්ම බලය ධනය මූලික කරගෙන සිදුවිය. ඒ සඳහා කදිම නිදසුනක් සේ ශ්‍රී ලංකාව දැක්විය හැකිය. ක්‍රි.ව 1815 දී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් වන්නේ එතෙක් වසර දෙදහස් පන්සියයක් තරම් කාලයක් පැවැති දේශීය රාජාණ්ඩු පාලනය අහෝසි කරමිනි.

**හැඳින්වීම හා පසුබිම**

මෙවක් පටන් ඇරඹෙන යටත් විජිතවාදි පාලනය තුළින් අසාධාරණයට පත්වන දේශිය ජනයා සංවිධානය වන්නේ තම අයිතිවාසිකම් හා නිදහස දිනා ගැනීමටය. එවැනි අවස්ථා බොහෝ ගණනක් ලක් ඉතිහාසයේ සඳහන් වන අතර 1818 හා 1848 යන වර්ෂ ප්‍රධාන සිදුවීම් සනිටුහන් කරයි. සන්නද්ධ සටන් ව්‍යාපාර මගින් දේශිය යුදකාමී නිර්භීත නායකයන්ගේ මූලිකත්වයෙන් ඇතිවන්නාවූ මේ නැගීසිටීම් අධිරාජ්‍යවාදීන් විසින් දරුණු ලෙස මර්දනය කරනු ලබයි. දහ නව වන සියවසේ නිදහස දිනා ගැනීම සඳහා වන අරගල මෙසේ සටන්කාමී ස්වරූපයක් ගත්ත ද විසිවන සියවසේදී ඒ තත්ත්වයෙන් බැහැර වූ යම් මධ්‍යස්ථ ප්‍රතිපත්තියකට දේශීය නායකයෝ ඇදී යති. ඔවුන් එය ක්‍රියාත්මක කරනු ලබන්නේ ව්‍යාපාරයක් ලෙසිනි. දේශිය සංස්කෘතිය සමාජය සදාචාරය පිරිහෙමින් පවතින අවස්ථාවක ඒ විපතින් රට මුදවා ගැනිම සඳහා ඉදිරියට එන පිරිස විසින් දියත් කරනු ලබන වැඩසටහන ව්‍යාපාරයකි. නිදහසින් වර්ෂ හැටහතක් පිරෙන මේ වර්ෂයේදී වර්තමාන ආර්ථික දේශපාලනික සමාජීය සන්දර්භයේ සිට සටන්කාමී ස්වරූපයෙන් මිදුණු මේ විසිවන සියවසේ නිදහස් ව්‍යාපාරයේ ගමන් මඟ පිළිබඳ මෙසේ අවධාරණය කළ හැකිය.

දහනව වැනි සියවස පුරාවටම පැවැති සන්නද්ධ වූ නිදහස් සටන් ව්‍යාපාරයේ මාවත වෙනස් කර මධ්‍යස්ථ මාවතකට නිදහස් සටන් ව්‍යාපාරය පත්වන්නේ විසිවන සියවසේ මුල්

* *තාවකාලික ප්‍රදර්ශක, පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය, hiran6361@gmail.com*

භාගයේදිය. මේ නිදහස් සටන් ව්‍යාපාරය මෙහෙය වන්නේ එකල ලංකාවේ පැවති ධනපති ප්‍රභූ පංතියේ උගත් තරුණයන් විසිනි. ඒ වන විටදී ලංකා සමාජයේ ධනපති පංති දෙකක් ඇති වී තිබුණි. ඒ කෝල්බෲක් කොමිසමේ ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයන් ලෙසිනි.

- විදේශීය ධනපති පංතිය - (වතු වගාකරුවන් බැංකුකරුවන් රාජ්‍ය නිලධාරීන්)
- දේශිය ධනපති පංතිය - (දේශීය වතු හිමියන්, මධ්‍යම පංතිය වූ වෛද්‍ය නීතිඥයන්, රජයේ සේවකයන්)

කෝල්බෲක් කොමිසමේ යෝජනා පරිදි මෙරට ඇතිකළ ව්‍යාපාර නිසාත් රජය විසින් ආර්ථික කටයුතුවලට දක්වන ලද දායකත්වය නිසාත් ව්‍යාපාරවල නියැලුණු දේශීයයන් එමගින් ධනවත් විය. මෙලෙසින්ම අධිරාජ්‍යවාදයේ අනුග්‍රහ ඇතිව ඉදිරියටත් පැවතීමට අධ්‍යාපනයේ හා අධිරාජ්‍යවාදීන් හා සමතැන් ගත යුතු බවත් අවබෝධ කරගත් මොවුහු තම දුවා දරුවන් විදේශ රටවල අධ්‍යාපනයට යොමු කරවන ලදී. මෙසේ විදෙස් ගතවී අධ්‍යාපනය ලබන තරුණ පිරිස් ඒ ඒ රටවල පවතින විවිධ වූ දේශපාලන දර්ශන හා අදහස් මතවාද වන ප්‍රජාතන්ත්‍රවාදය නිදහස සමානාත්මතාවය යන සංකල්ප කෙරේ උගනිති. බටහිර පන්නයට හැඩ ගැසුණු ජීවන රටාවක් හිමි මොවුහු උසස් ජීවන තත්ත්වයක් ද හිමි කර ගනී. පෙරළා මෙරටට පැමිණෙන මේ පිරිස දකින්නේ අධිරාජ්‍යවාදීන් විසින් මව්බිම යටත් කර ගැනීමේ එල විපාකයි. එතැන් සිට ඔවුන් ක්‍රියාත්මක වන්නේ තමන් උගත් සංකල්ප ක්‍රියාත්මක කිරීම මඟින් නිදහස දිනා ගැනීමටයි. මේ උගත් ලාංකික පිරිස විසින් නායකත්වය දෙනු ලබන ව්‍යාපාරය විසිවන සියවසේ නිදහස දිනා ගැනීමේ ව්‍යාපාරයයි. මෙය ජාතික ව්‍යාපාරය නම් වේ.

මේ ව්‍යාපාරය උක්ත කී අන්දමින් ක්‍රියාත්මක වන්නේ මධ්‍යස්ථ ව්‍යාපාරයක් ලෙසිනි. එනම් මේ වන විට පිහිටුවා තිබූ ව්‍යවස්ථාදායක සභාවේ වැඩි නියෝජනය ඉල්ලමින් යම් යම් අවස්ථාවලදි උද්ඝෝෂණවල යෙදෙමිනි.

**ජාතික ව්‍යාපාරයක් බිහි කිරීම හා පෝෂණය කිරීම සිදුකළ බලවේග – අමද්‍යප ව්‍යාපාරය**

ජාතික ව්‍යාපාරයේ ප්‍රධානතම බලවේගය වූයේ මෙයයි. අධිරාජ්‍යවාදීන් විසින් ඇතිකර තිබූ සුරා බදු ප්‍රතිපත්තියට හා සුරාව ප්‍රචලිත කිරීමේ ව්‍යාපාරයට එරෙහිව මෙම අමද්‍යප ව්‍යාපාරය බිහිවිය. ලාංකීය සමාජයේ සදාචාරය හා සංස්කෘතික සාරධර්මවලට මේ මධ්‍යසාර මඟින් එල්ල වූයේ බලවත් පහරකි. මේ ව්‍යාපාරය සඳහාද උගත් දේශිය මධ්‍යම පංතිය නායකත්වය ලබා දෙයි. මේ සඳහා මුල්ම පියවර තබන්නේ ක්‍රිස්ත්‍රියානි මිෂනාරින් විසිනි. මෙම මධ්‍යසාරය ප්‍රචලිත කිරීමේ ව්‍යාපාරයේ ආදිනව තේරුම් ගත් මේ මිෂනාරින් ඒ සඳහා ක්‍රියාත්මක විය. "ලංකා අමද්‍ය සඟරාව" නමින් සඟරාවක් ඇති කළේද ඒ වෙනුවෙනි.

මෙම ව්‍යාපාරයේ තීරණාත්මක අවධි දෙකක් හඳුනා ගත හැකිය.

- 1890- හා 1905 අතර ව්‍යාපාරයේ මුල් ආරම්භක කාලය (ප්‍රාදේශිය හා ගම් මට්ටමින්)
- 1905 න් පසු කාලය (ජාතික මට්ටමින්)

මුල් කාලීනව ග්‍රාමීයව විකාශය වූ මේ ව්‍යාපාරය කල් යත්ම ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වූයේ මෙහි ඇති වටිනාකම රටම හඳුනා ගත් හෙයිනි. 1904 දී "කොග්ගල නොබොන සමාගම" සී.පී ද සිල්වා මහතා විසින් ඇරඹීම හා ඒ ආශ්‍රිතව අමද්‍යප සමිති රට පුරා බිහිවීම දක්නට ලැබේ. සිංහල ජන නායකයින් ව්‍යාපාරයට සම්බන්ධ වීමත් සමඟ ව්‍යාප්තිය තීව්‍ර විය. අනගාරික ධර්මපාලතුමා, වලිසිංහ හරිස්චන්ද්‍ර, පී.ඒ සිල්වා, ඩබ්ලිව්.ඒ සිල්වා, ඩී.බී ජයතිලක යන නායකයෝ මෙහි ප්‍රධානියෝ වූහ. ව්‍යාපාරයේ එක් ජයග්‍රහණයක් ලෙස 1904 ජූලි 12 දින කොළඹදී අමද්‍යප සංගමයක් බිහි වීම හඳුන්වා දිය හැකිය. මේ සමගින් වැලිකඩ, රත්මලාන, වේයන්ගොඩ, පානදුර යන ස්ථානවලදීත් අමද්‍යප සංගම් බිහිවිය. සංගමයේ ව්‍යාප්තිය කොතරම්ද යත් 1904 අගෝස්තු හිදී අමද්‍යප සමිති 200 ක්ද ඔක්තෝම්බර් වන විටදී සමිති 422 ක්ද විය. සරසවි සඳරුස පුවත්පත වාර්තා කළ පරිදි මුළු සමිති ගණන 478 ක්ද සමස්ත සාමාජිකයින් 180000 විය. ගම්මුලාදෑනින් පවා අමද්‍යප සංගම් බිහි කිරීමට පියවර ගැනීම සංගමයේ ව්‍යාප්තිය පෙන්වීමට කදිම නිදසුනකි. සෑම ගමකම අමද්‍යප සමිති බිහි කිරීමටත් කවි පොත් පත්‍රිකා බෙදීම (අමද්‍යප මිත්‍රයා) යනාදී උත්සාහයන් මඟින් ජනතාව වෙත සංගමය තවත් ළං විය. මේ ක්‍රියාමාර්ග සිදුවන අතරේම මේ සංගම් හා සංවිධාන විසින් දිගින් දිගටම උද්ඝෝෂණය කළේ රජයේ ප්‍රචාරක ව්‍යාපාරයට එරෙහිවය. මේ ක්‍රියාමාර්ග අවසානයේදී සංගමයට ජයග්‍රහණ රැසක් හිමිවිය. ඒ අතර රේන්දකරුවන් බියවීම හා උද්ඝෝෂණ හා සංගම් නතර කිරීමට පියවර ගන්නා ලෙස ආණ්ඩුවට දැනුම් දීමත් ගාල්ලේ තැබෑරුම් වල සේවකයින් ඉවත් කිරීමට පවා සිදු වීමත් ඒ අතර විය.

1909 වර්ෂය ව්‍යාපාරයේ වැදගත් සංධිස්ථානයකි. 1909 අප්‍රියෙල් 7 සුරාබදු පණත සම්මත වූ අතර පණත ගෙන ආ මේ වර්ෂයේදී ලංකාවේ රා අරක්කු තැබෑරුම් ගණන 845 ක්ද 1912 දී 1072 ක්ද හා 1912 අවසන් වන විටදී එය 1667 ක් ලෙසින් වර්ධනය විය. සිංහල ජන නායකයින්ගෙන් මීට බොහෝ විවේචන එල්ල විය. ස්පෙටර් සේනානායක ඩී.එස්, එෆ්. ආර්, ඩී.පී සේනානායක යන අය මැදිහත් මේ සඳහා මැදිහත් වීම දක්නට ලැබේ. ඩී.බී ජයතිලක, මාකස් ප්‍රනාන්දු, වෛද්‍ය ඩේවිඩ් රොක්වුඩ්, සී.ඒ හේවාවිතාරණ, ඩී.ආර් විජයවර්ධන ආදීහු පණතේ ව්‍යසනකාරී බව පෙන්වූහ. මේ වන විටදිත් ප්‍රාදේශියව සංගම් පිහිටා තිබුණත් සමස්ත ඒකාබද්ධ සංවිධානයක් පැවතියේ නැත. මීරිගම හාපිටිගමු කෝරළේ සියලුම තැබැරුම් වසා දැමීමට උද්ඝෝෂකයන් ප්‍රමුඛ සිංහල ජන නායකයන්ට හැකි වූ හෙයින් එය විශාල ජයග්‍රහණයක් විය. එසේම එය වෙනත් ප්‍රදේශවල ජනයාටද ආදර්ශයක් විය.

කෙසේ වුවද ලංකාවේ ජාතික ව්‍යාපාරය සඳහා අමද්‍යප ව්‍යාපාරය විසින් ලබා දෙන ලද්දේ මහඟු මෙහෙවරකි. අධිරාජ්‍යවාදීන් කෙරේ විරුද්ධ වෛරී හා ඔවුන් ප්‍රතික්ෂේප කරන ජනතාවක් ඇති කිරීමට මෙමගින් හැකිවිය. එසේම මෙම ව්‍යාපාරය හුදෙක් ප්‍රභූ පැළැන්තියට පමණක් සීමා වූ එකක් නොවීය. එය සමස්ත සාමාන්‍ය ජනයාගේ ව්‍යාපාරයක් විය. ඒ සඳහා ප්‍රභූ හෝ දුප්පත් පොහොසත් සියලුම දෙනා එක්වීම සුවිශේෂී සිද්ධියකි. මේ ව්‍යාපාරයෙන් ඉටු වූ ප්‍රධානතම මෙහෙය නම් පසුකාලීන ජාතික ව්‍යාපාරය සඳහා නායකයින් බිහි කිරීමයි. ජාතික සංගමයේ නායකයින් සියලු දෙනාම පාහේ මේ ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකයෝ

වූහ. සැබැවින්ම 1919 දී ජාතික සංගමය ලෙසින් දී බිහිවන්නේ මේ අමද්‍යප ව්‍යාපාරයම යැයි සඳහන් කිරීම බෙහෝ දුරට නිවැරදිවේ. නමුත් මේ වන තෙක්ම ජාතික නිදහස උදෙසා ක්‍රියාත්මක වන්නාවූ ජාතික සංවිධානයක් නොවීය.

**1915 සිංහල මුස්ලිම් කෝලාහලය**

ජාතික සංවිධානයක හෝ ජාතික එක්සත් බවක අවශ්‍යතාව දනුණ තවත් අවස්ථාවක් ලෙසින් 1915 සිංහල මුස්ලිම් කෝලාහලය හැඳින්විය හැකිය. සිංහල හා මුස්ලිම් යන දෙපිරිස අතර ඇතිවූ මෙම ආරවුල කැරැල්ලක් දක්වා වර්ධනය වී ගිය අතර මහත් ආන්දෝලනයක් ඇති වීමට ද හේතු විය. මේ පිළිබඳ ආණ්ඩුකරු වූ රොබට් චාර්මස් ප්‍රකාශ කළේ මෙවැන්නකි.

"මෙම තත්ත්වය උඩරටට පමණක් සීමා වුණි නම් තමන්ට එය මර්දනය කළ හැකිව තිබූ බවත් පහතරට ප්‍රදේශ සඳහාත් ව්‍යාප්ත වූ හෙයින් ඒ සඳහා දැඩි පියවර ගැනීමටද සිදු වූ බවත්ය" (ජයවර්ධන,2004,154) යටත් විජිත ලේකම් මේ පිළිබඳ දැරූවේ මෙවැනි අදහසකි. " ඔවුහු පිළිකුල් සහගත නිවටයන් රැළකි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් යුරෝපයේ අධ්‍යාපනය ලද බැව්, එකකු දෙන්නෙකු කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් බැව් කීමට මම කණගාටු වෙමි". (ජයවර්ධන,2004,154)

ගැටලුව ඇති වුයේ 1912 දී ගම්පොළදීය. ගම්පොළ වළහගොඩ දේවාලයේ බෞද්ධ සාම්ප්‍රදායික පෙරහැර ගමන් කිරීමේදී මුස්ලිම් පල්ලි අසලදී හෝ තූර්ය වාදන නොනැවැත්වීම ගැන මුස්ලිම්වරු විරෝධය පළ කළහ. මේ පිළිබඳ සිංහලයෝද විරෝධය පළ කළේ එය තම සාම්ප්‍රදායික අයිතියක් සේ කියමිනි. 1914 දී මහනුවර දිස්ත්‍රික් උසාවිය බෞද්ධයන්ට පක්ෂව නඩු තීන්දුවක් ලබා දෙන අතර 1915 පෙබරවාරියේදී එම තීරණය වෙනස් කර නැවත මුස්ලිම්වරුන්ට පක්ෂව තීන්දුවක් ලබා දෙන ලදී. දිනමිණ සිංහල බෞද්ධයා, සරසවි සඳරැස වැනි පුවත්පත්වලින් මේ සඳහා විශාල ප්‍රසිද්ධියක් ලබා දෙන ලද අතර මෙකල ආණ්ඩුක්‍රම උද්ඝෝෂණවල හා පරම විඥානාර්ථවාදී මෙන්ම අමද්‍යප ව්‍යාපාරයේ සිටි නායකයෝ ද මේ පිළිබඳ කුමන තීරණ ගත යුතු දැයි සාකච්ඡා කළහ.

නමුත් නැවතත් 1915 දී පවත්වන ලද පෙරහැර මුස්ලිම් පල්ලියක් අසලදී තූර්යවාදන නොනැවැත්වීම පිළිබඳ මුස්ලිම්වරු නැවත විරෝධය පළ කළ හෙයින් මහනුවර වෙසක් උත්සවය සඳහා පැමිණ සිටි බෞද්ධයෝ රැසක් කුපිත වූහ. මුස්ලිම්වරුන් පිළිබඳ කටකතා පැතිර ගියෙන් තත්ත්වය දරුණු වී පෙබරවාරි 29 හා 30 යන දිනවලදී මහනුවර නගරයේ ගැටුම් ඇති විය. ගැටුම් හා කෝලාහල වෙනත් පළාත්වලට ද පැතිර ගියෙන් ආණ්ඩුවට සිදු වූයේ යුද නීතිය පනවා ඒ පළාත් සඳහා හමුදා පිටත් කිරීමටයි. මෙසේ පිටත් වූ හමුදාව විසින් නිරායුධ හා නිර්දෝෂී සාමාන්‍ය වැසියන්ද කිසිදු විභාගයකින් තොරව වෙඩි තබා මරා දමන ලදී. එලෙසින්ම පොලීසියද ක්‍රියාත්මක විය. මේ වෙඩි තැබීම් නිසා බොහෝ දෙනෙක් මිය ගියහ. මේ අවස්ථාවේදීම සන්නද්ධව සිටි බ්‍රිතාන්‍ය වතු හිමියෝ ද, සිවිල් නිලධාරීහු ද වෙඩි තැබීම සිදු කළහ. ඒ කිසිම විභාගයකින් තොරවය. කෙසේ වුවද ආණ්ඩුව විසින් මේ කෝලාහාලය දරුණු ලෙස මර්දනය කරන ලදී.

මේ වන විටදී අමද්‍යප ව්‍යාපාරය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉල්ලා උද්ඝෝෂණවල නිරත වූ එෆ්.ආර් සේනානායක, ඩී.එස් සේනානායක, ඩී.සී සේනානයක, යන සහෝදරයන්ද ඩී.බී ජයතිලක, සී.ඒ හේවාවිතාරණ, ආතර් වි දියෙස්, ජෝන්ද සිල්වා, වෝල්ටර්ද සිල්වා යන සිංහල ජන නායකයින් අත්අඩංගුවට ගැනීම නිසා සිංහල ජනයා වඩාත් කුපිත විය. මෙකලම කුරුණෑගල දී පවත්වන ලද බෞද්ධ පෙරහැරකට මුස්ලිම්වරු විසින් පහර දී ආක්‍රමණශීලි බවක් පෙන්වන ලදී. මේ තත්ත්ව කෝලාහලය තවත් වර්ධනය කිරිමට සමත් විය. (බණ්ඩාර,2007,366) එම තත්ත්වය මංකොල්ල කෑම්, කඩ සාප්පු ගිනි තැබීම වැනි දේපල හානි දක්වා වර්ධනය වූයේ විදුලි වේගයෙනි. මුළු රටම එකම කලබගෑනියක් බවට පත් විය.

මෙම සිද්ධිය ආණ්ඩුව දූක්කේ තම පාලනයට එරෙහි වූ සිංහලයන්ගේ ජාතිකවාදි නැගිටිමක් ලෙසිනි. අවසානයේදී සිංහල ජනයා හට මහත් වූ අසාධාරණයකට මුහුණ දිමට සිදු විය. එනම් සිංහල නායකයන් වු විලියම් පේද්‍රික් වැනි නායකයින් කිහිප දෙනෙක් කිසිදු වග විභාගයකින් තොරව මරා දමන ලද අතර මුස්ලිම්වරුන් හට වන්දි ගෙවීමටද නියම කරන ලදි. කෙසේ වුවද මෙම අරගලය බ්‍රිතාන්‍ය පාලකයන්ට එරෙහිව සිංහලයන් අතර ප්‍රබල වූ එකමුතුවක් ඇති කිරිමට හේතු විය. ඒ සඳහා මෙම අවස්ථාවේදී ආණ්ඩුව ක්‍රියා කළ අන්දමත් ඊට හේතුවක් ම විය. එසේම මෙම අරගලයෙන් ජාතික නායකයන්ට වැදගත් අත්දැකීමක් ලබා ගැනීමට අවකාශ සලසන ලදී. ඒ නම් මෙවැනි අවස්ථාවල එක්සත්ව කටයුතු කිරිමට ප්‍රබල ජාතික සංවිධානයක අවශ්‍යතාව මතුවීමයි.

මේ අවස්ථාවේදී බ්‍රිතාන්‍ය පළමු ලෝක යුද්ධයට පැටලී සිටි හෙයින් දේශිය ප්‍රශ්න කෙරේ අවධානය යොමු කිරිම වෙනදාට වඩා අල්ප විය. මේ අවස්ථාවේදිත් ලාංකික ජන නායකයින් තම පක්ෂපාතී බව රජය වෙත බව කීවේය. ඒ මගින් ඇතිවන ප්‍රතිසංස්කරණ හා වැඩි නියෝජනයක් ලබා ගැනීමට මෙය අවස්ථාවක් බව සිතුවේය.

**ඉන්දීය නිදහස් සටන් ව්‍යාපාරය**

මේ වන විටදී ඉන්දියාව නිදහස දිනා ගැනීම සඳහා පුළුල් හා ශක්තිමත් ව්‍යාපාරයක නියැළී සිටියේ ය. එය රැඩිකල්වාදි හා සටන්කාමී ව්‍යාපාරයක් වූවා සේම එහි පැවති සත්‍යග්‍රහ, උද්ඝෝෂණ හා වර්ජන වැනි ක්‍රියාකාරකම් හමුවේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව මහත් අපහසුතාවන්ට ලක්විය. සුභාෂ් චන්ද්‍රබෝෂ්, භගත් සිං වැන්නවුන් මෙම ව්‍යාපාරයේ සටන්කාමීන් වු අතර ජවහර්ලාල් නේරු, මහත්මා ගාන්ධි යන මධ්‍යස්ථවාදින්ද මේ හා එක්වී සිටි ප්‍රබලයෝ වූහ. මෙය සමස්ත ඉන්දීය ඒකාබද්ධ සංවිධානයක් වූ අතර එය ඉන්දියාවේ නිදහස දිනා ගැනීම සඳහා වු ජාතික ව්‍යාපාරයද විය. ලංකාවේ නායකයින්ටද මේ අනුභූතිය දේශීයව ජාතික ව්‍යාපාරයක් ඇති කිරිමට ආධාර කළේය. තමන්ද මෙවැනි ව්‍යාපාරයක් ඇරඹිය යුතු යැයි යන සිතුවිල්ල මේ හරහා ජනිත විය. මේ ආභාෂය ගත් ලාංකිකයන්ගේ එකමුතුවක් ගැන ආණ්ඩුව නිරන්තරයෙන් බියෙන් පසු වූ අතර සෑම විටකට එවැන්නක් දියාරු කර හැරීමට උත්සාහ ගැනීම පෙනෙන්නට ඇත. (සිල්වා,1999,318)

**විවිධ සමාජ සංවිධාන**

උක්ත කී අන්දමින් කෝල්බෲක් කොමිසමේ මහිමයෙන් මෙරට දේශිය මධ්‍යම ධනපති පංතියක් බිහිවී තිබුණි. මෙම පිරිස් ඒ ආශ්‍රිතව ව්‍යාපාරවල නියැලී සිටි අතර මධ්‍යම පාංතිකයන් ගේ මේ ව්‍යාපාරවල ව්‍යාප්තියක් දක්නට ලැබුණි. එම ව්‍යාපාරවලට යම් යම් පහසුකම් ලබා ගැනීම සඳහාත්, යම් යම් ආර්ථික අරමුණු සඳහාත් මෙන්ම එම මධ්‍යම පාංතික උගත් ලාංකිකයන්ගේ දේශපාලන අවශ්‍යතා සඳහාත් ඔවුන් විසින් යම් යම් සංවිධාන පිහිටුවා ගන්නා ලදි. මොවුන්ගේ මූලික අභිප්‍රාය වූයේ ව්‍යවස්ථාදායකය තුළ ඉහළ නියෝජනයක් ලබා ගැනීමත් ඒ මඟින් තම ව්‍යාපාර ශක්තිමත් කර ගැනීමයි. මෙම සංවිධාන ලෙසින්

- මිනිරන් වෙළඳුන්ගේ සංගමය
- ලංකා කෘෂිකාර්මික සංවිධානය
- පහතරට නිෂ්පාදන සංවිධානය
- ලංකා ජාතික සංවිධානය
- යාපනය සංවිධානය
- හලාවත සංවිධානය
- ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සමිතිය

යන ලෙසින් මෙම සංවිධාන හඳුන්වා දිය හැකිය. කෙසේ නමුත් මෙම සංවිධානවල ඒකාබද්ධ බවක් නොතිබූ අතර තැන් තැන්වල විසිරී තිබූ විවිධ වූ අවශ්‍යතා සහිත සංවිධාන විය. නිල නොලත් සභිකයන්ගෙන් යුක්තව මුල් කාලීනව බිහිවන්නාවූ "සිලෝන් ලීග්" නම් සංවිධානයද එවැන්නකි. (සිල්වා,1996,194)

**ලංකා ජාතික සංගමය පිහිටුවීම**

මේ වන විටදි පැවති ජාතික කොංග්‍රසය, තරුණ සංගමය යනාදී තවත් බොහෝ සංවිධානවල එකමුතුවෙන් 1919 දී ලංකා ජාතික සංගමය පිහිටුවන ලදී. මෙය ආණ්ඩුක්‍රම උද්ඝෝෂණ ව්‍යාපාරයේ ඉදිරි පිම්මක් බඳු විය. බහු වාර්ගික වූ ලංකා සමාජයේ ජාතික එකමුතුවක සේයාවක් ඉන් පෙන්නුම් කෙරිණි මධ්‍යස්ථ හා රැඩිකල්වාදී යන දෙපිරිසම මෙයට ඇතුළත් වූහ. (සිල්වා,1996,318)

1918 පමණ වන විටදි ලංකා ප්‍රතිසංස්කරණ සම්මේලනය තීරණය කළාවූ මධ්‍යගත සංවිධානයක අවශ්‍යතාව වෙනුවෙන් 1919 දෙසැම්බර් 11 දින සිට ලංකා ජාතික සංගමයේ පළමුවන සැසිවාර පවත්වන ලදී. උක්ත කී ප්‍රාදේශිය සංවිධාන ද තවත් බොහොමයක් ද මේ සඳහා එකවි සිටි අතර ජාතික සංගමය බිහි කිරිම හේතුවෙන් එම සංවිධානවල නායකයෝ තමන් අතර පොදු අවශ්‍යතාව වූ වැඩි නියෝජනය වෙනුවෙන් පොදු එකඟතාවක් ඇති කර ගත්හ. ඒත් සමඟ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරය මධ්‍යගත පදනමකට ගෙන ඒමට සමත් විය. ජාතික දේශපාලන ව්‍යාපාරයට මධ්‍යම

ආරම්භයක්ද මේ මඟින් ලැබුණි. (බණ්ඩාර,2007,පි. 438) මෙතැන් සිට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපාරය දියත් වූයේ මේ ජාතික සංගමය හරහාය.

කෙසේ වුවද මේ සංගමයේ අදහස් වර්ග දෙකක් නියෝජනය විය. ඒ ඉහළ නියෝජනයක් ඉල්ලා උද්ඝෝෂණයේ යෙදෙන්නාවූ මධ්‍යස්ථ මතධාරීන්ගේ කණ්ඩායමත් සටන්කාමී රැඩිකල්වාදී තරුණ කණ්ඩායමත් යන ලෙසිනි, මේ රැඩිකල් තරුණ කණ්ඩායම් නියෝජනය කළේ කම්කරු පංතියයි. ඒ.ඊ ගුණසිංහ ඒ අතර ප්‍රධානියෙක් විය. 1922 න් පසුව ඉදිරියට ආ කම්කරු නායකයන්ට සංගමයෙන් බොහෝ හිරිහැර එල්ල විය. අවසානයේදී ඒ. ඊ ගුණසිංහ මහතා ජාතික සංගමයෙන් ඉවත් වී 1923 දී ලංකා කම්කරු සංගමය පිහිටුවන ලදී. මහා වැඩවර්ජන ඇති කිරීමට පාර කපන ලද්දේ මේ කම්කරු සංවිධානය විසිනි. මේ කාලයේ ලෝක යුද වාතාවරණය නිසා ලංකාවේ භාණ්ඩ හා ආර්ථිකමය අපහසුතා බොහෝ පැවතියේය. රජය සතුව ඒ සඳහා විසඳුම් නැති බවත් ලංකා ජාතික සංගම් ව්‍යාපාරයේ ඉබි ගමනත් හෙතෙම බොහෝ සෙයින් විවේචනයට ලක් කළේය. එසේම මේ කාලයේදී රජය විසින් ඇති කළාවූ ප්‍රතිසංස්කරණ පිළිබඳ දෙපිරිසම සිටියේ එතරම් සතුටුදායක ප්‍රතිපත්තියක නොවේ. ආණ්ඩුව අපහසුතාවට පත් කිරිම සඳහා සෑම අවස්ථාවක්ම යොදා ගැනීමට දෙපිරිසම සූදානමින් සිටියේය. සුබවාදී ප්‍රතිසංස්කරණ සඳහා උද්ඝෝෂණය කළ යුත්තේ දැඩි බලපෑමක් දනෙන සේ වැඩ වර්ජන වැනි ක්‍රියා මාර්ග හරහා යැයි ගුණසිංහ මහතාගේ රැඩිකල්වාදී නිර්දේශය විය. 1923 දුම්රිය සේවක වර්ජනය එවැන්නක් වූ අතර කම්කරු ව්‍යාපාරයේ බලය අධිකාරීන්ට දනුණ අවස්ථාවක් ද විය. මේ අවස්ථාව පසුකාලීන කම්කරු නායකයන්ට ඉදිරි දේශපාලන ගමන සඳහා පූර්වාදර්ශයක්ම විය.

**ආණ්ඩුක්‍රම උද්ඝෝෂණ ව්‍යාපාර**

1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රමය ලංකාවේ මුල්ම විධායක ආණ්ඩුක්‍රමය වූ අතර ව්‍යවස්ථාදායක නියෝජන ක්‍රමයේ ආරම්භයද විය. මෙහි සංයුතිය 15 දෙනෙක් වූ අතර 9 දෙනෙක් නිලලත් මන්ත්‍රීවරු වූ අතර ඔවුන් සියලුම දෙනා යුරෝපා ජාතිකයින් විය. 6 දෙනෙක් නිල නොලත් නියෝජිතයින් විය. මේ 6 දෙනාගෙන් තිදෙනෙක් යුරෝපීන් වෙනුවෙන්ද ජාතිමූල නියෝජනය පරිදි ඉතිරි තිදෙනාද පත් විය. කල් යාමේදී මේ නියෝජන ක්‍රමයේද යම් යම් අඩුපාඩු පවතින බවත් නිල නොලත් නියෝජිතයින්ගේ නියෝජනය අල්ප බවත් මෙන්ම ජාතිමූල නියෝජනය අහෝසි කළ යුතු බවත් දක්වමින් උද්ඝෝණෂණ ආරම්භ විය. පසුව 1910 දී මැකලම් ආණ්ඩුක්‍රමය හඳුන්වා දෙන ලද්දේ මේ සඳහා පිළියමක් ලෙසිනි.

තත්ත්වය මෙසේ පවතිද්දී 1910 මැකලම් ආණ්ඩුක්‍රමය හඳුන්වා දෙන්නේ උද්ඝෝෂකයන්ගේ ඉල්ලීම්වලට පිළියමක් ලෙසිනි. ඊට අනුව ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය වුයේ 21 දෙනෙකි. එයින් නිලලත් මන්ත්‍රීන්ගේ ගණන 11ක් වූ අතර නිල නොලත් මන්ත්‍රීන් 10 ක් විය. නිල නොලත් මන්ත්‍රීන් 10න් 4 දෙනෙක් ඡන්දයෙන්ද ඉතිරි 6 දෙනා නාමකරණයෙන් ද පත් විය. මේ ඡන්ද බලය හිමිවුයේ දේපල හිමිවීම හා උගත්කම මතය ඉල්ලීම් පරිදි නිල නොලත් බහුතරයක් ලබා දුන්නේ ද නැත්තා සේම ආණ්ඩුකාරයාගේ බලතල සීමා වීමක්ද නොවිණි. එසේම මන්ත්‍රීන් නාමකරණයෙන් පත් කිරිම දිගින් දිගමට

සිදු විය. මේ ප්‍රතිසංස්කරණයද කෙරේ මධ්‍යම පංතිකයින් සෑහීමකට පත් වූයේ නැත. දිගින් දිගටම උද්ඝෝෂණ ව්‍යාපාරය පවත්වා ගෙන ගිය අතර අරමුණ වූයේ පාලනය සම්බන්දව වැඩි බලතල ප්‍රමාණයක් දේශීය නායකයින් වෙත ලබා ගැනීමයි. එනම් නිදහස ඉල්ලා මධ්‍යස්ථ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ අන්දමයි. මේ අතර සිදුවන සිංහල මුස්ලිම් කෝලාහලයත් අමද්‍යප ව්‍යාපාරයේ කටයුතුත් උද්ඝෝෂණ ව්‍යාපාර දිරි ගන්වන්නක්ම විය.

කෙසේ නමුත් මැකලම් ප්‍රතිසංස්කරණයද තමන්ට ඵල රහිත බව පෙන්වා දුන් ජාතික සංගමය ප්‍රමුඛ සිංහල ජන නායකයෝ නැවතත් වැඩි බලතල සහිත පාලනයක් ඉල්ලා යුහුසුළු වූහ. 1920 දි මැනිං ආණ්ඩුක්‍රමය හඳුන්වා දෙන්නේ ජාතික සංගමට ප්‍රමුඛ මේ උද්ඝෝෂකයින්ගේ ඉල්ලිම්වලට ප්‍රතිචාරයක් වශයෙනි. ඒ අනුව ව්‍යවස්ථාදායක සභාව තවත් පුළුල් වු අතර සමාජිකයින් සංඛයාව 37 දක්වා වර්ධනය විය. මිට අනුව ප්‍රථම වරට නිල නොලත් මන්ත්‍රින්ගේ සංඛයාව ඉහල ගියේය. නිල නොලත් මන්ත්‍රීන් 23 ක්ද නිල ලත් මන්ත්‍රීන් 14 ක් ද විය. එම 23 දෙනොගෙන් 16 දෙනෙක් මහජන ඡන්දයෙන් තෝරා ගැනුන අතර එම 16 දෙනා වුයේ පළාත් බද ඡන්දයෙන් 11 ක් ද විශේෂ ඡන්ද ක්‍රමයක් යටතේ 5ක්ද ලෙසිනි. කෙසේ නමුත් මෙම ආණ්ඩුක්‍රමයද සංශෝධනය කිරිමේ ප්‍රතිපලයක් ලෙසින් 1923 දි මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමය හඳුන්වා දෙන ලදී. පැහැදිලිව පෙනෙන පරිදි මේ ක්‍රමයේදි නම් නිල නොලත් පිරිස බහුතරයක් වු අතර සමස්ථ ව්‍යවස්ථාදායකයම 49 දෙනෙකුගෙන් සමන්විත විය. එයින් 37 නිල නොලත් වු අතර නිල ලත් වූයේ 12 දෙනෙකි. මේ අවස්ථාවේදි නම් ව්‍යවස්ථාදායකය නියෝජන ව්‍යවස්ථාදායකයක් යැයි කිව හැකි මට්ටමේ විය. එසේම ආණ්ඩුකාරයාගේ බලතලද යම් දුරකට සීමා කර තිබුණි. කෙසේ වුවද මේ ආණ්ඩුක්‍රමයේ යම් යම් දුර්වලතා ඇති බව පෙන්වා දුනි. ඒ නම්

- ආණ්ඩුකාරයාගේ බලතල සිමා කළත් ආණ්ඩුකිරීමේ අයිතිය සම්පූර්ණයෙන්ම ඔහුට හිමිවීම.
- නිල නොලත් පිරිස වැඩි වුවත් ඔවුන් අත ප්‍රමාණවත් බලයක් නොතිබිම.
- එසේ හෙයින්ම වගකීම් හා පාලන බලය වෙන් වෙන්ව පැවතීම.
- ව්‍යවස්ථාදායක හා විධායක සභා අතර සම්බන්ධීකරණයක් නොතිබීම.
- සීමිත ඡන්ද බලය.
- ජාතිමූල නියෝජනය තවදුරටත් පැවතීම.

යන හේතුන් නිසා පිරිස වැඩි වුවත් ගුණාත්මක බවින් තොරවිය. මේ අඩුපාඩකම් නිසාද මේ සඳහා එල්ල වූ විවේචන නිසාද නැවතත් ආණ්ඩුක්‍රමයක් පත් කර එවිම සඳහා උද්ඝෝෂණ ඇරඹිණි. ඒ සඳහා පරීක්ෂණ පැවැත්විම සඳහා ඩොනමෝර සාමි, බට්ලර්, ෂිල්ස්, මැතිව්ස් යන නියෝජිතයන්ගෙන් සමන්විත වූ කණ්ඩායමක් 1927 දි මෙරටට පැමිණියේය. මේ ආණ්ඩුක්‍රමයෙන් අරමුණු කළේ දේශීයයන් වෙත වැඩි බලතල ලබාදෙන වගකීම් සහගත ආණ්ඩුක්‍රමයක් ඇති කිරීමයි.

ඉහත කී දුර්වලතා සඳහා පිළිතුරක් ලෙසින් 1931 දී ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හඳුන්වා දෙන ලදී. එය මෙතෙක් ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම මෙන් නොව වැඩි බලතල ප්‍රමාණයක්

ලාංකිකයන් වෙත ලබා දීමට සමත් විය. බැලූ බැල්මට පෙර තත්ත්වයන්ට වඩා විධායක බලයක් හිමිවීම විශේෂ ලක්ෂණයක් විය. මෙම කොමිසමේ ලක්ෂණ වූයේ

- සර්ව ජන ඡන්ද බලය ලබාදීම
- විධායක කාරක සභා ක්‍රමය
- රාජ්‍ය මන්ත්‍රණ සභාව
- රාජ්‍ය නිලධාරීන්
- ඇමති මණ්ඩලය
- ආණ්ඩුකාරතුමා

ආණ්ඩුක්‍රමයේ ප්‍රධානම යෝජනාවක් වූයේ සියලුම පුරවැසියන්ට ඡන්ද බලය ප්‍රදානය කිරීමයි. මේ යටතේ වයස විසි එකට වැඩි පුරුෂයන්ටත් වයස අවුරුදු තිහට වැඩි ස්ත්‍රීන්ටත් ඡන්ද බලය ලබා දිණි. පූර්වෝක්ත ක්‍රමය යටතේ ඡන්ද බලය පැවතියේ සමස්ත ජනගහනයෙන් සියයට හතරක ප්‍රමාණයකටය. සර්ව ජන ඡන්දයෙන් බලාපොරොත්තු වූයේ ඒ මගින් ලාංකිකයන්ගේ දේශපාලන වගකීම් වැඩි කිරීමයි. වැඩෙමින් තිබූ දේශපාලන සංස්කෘතියට අනුරූපිව ජනයාගේ දේශපාලන සහභාගීත්වය ඉහළ නැංවීම බලාපොරොත්තු විය. රාජ්‍ය මන්ත්‍රන සභාවට නියෝජිතයන් පණස් දෙනෙක් මහජන ඡන්දයෙන් තෝරා ගත් අතර මෙය පූර්වෝක්ත තත්ත්වයට වඩා ඉහළ ජයග්‍රහණයක් විය. මේ ආණ්ඩුක්‍රමයෙන් විශේෂිත වූ සංකල්පයක් හඳුන්වා දෙන ලදී. ඒ විධායක කාරක සභා ක්‍රමයයි. සැබැවින්ම මෙහි අරමුණද වූයේ විධායක බලයක් ලබා දීමයි. කොමිසමේ යෝජනා අනුව මේ රාජ්‍ය මන්ත්‍රණ සභාව ව්‍යවස්ථාදායක හා විධායක සභාවක් වශයෙන්ද කටයුතු කරන ලදී. කතානායක හා රාජ්‍ය නිළධාරීන් තිදෙනා හැර සෙසු සියලුම මන්ත්‍රීන් කාරක සභා හතකට බෙදිණි. ඒ නම්

- ස්වදේශ කටයුතු පිළිබඳ කාරක සභාව
- කෘෂිකර්ම කටයුතු පිළිබඳ කාරක සභාව
- පළාත් පාලන කටයුතු පිළිබඳ කාරක සභාව
- සෞඛ්‍ය කටයුතු පිළිබඳ කාරක සභාව
- අධ්‍යාපන කටයුත පිළිබඳ කාරක සභාව
- ගමනාගමන හා පොදු වැඩ පිළිබඳ කාරක සභාව
- කම්කරු කර්මාන්ත හා වෙළඳාම් පිළිබඳ කාරක සභාව

මේ යටතේ විධායක බලයෙන් දහයෙන් හතක බලයක් ලාංකිකයන්ට ලැබිණි. එනම් විධායක කාරක සභා හතෙහි බලයයි. රාජ්‍ය නිලධාරීන් වූ මුදල් ලේකම්, නීති ලේකම්, හා අධිකරණ ලේකම් යන බලතල පැවතියේ බ්‍රිතාන්‍ය නිලධාරීන් යටතේය. මේ ක්‍රමයේදී බැලූ බැල්මට නම් විශාල බලයක් ලාංකිකයන්ට හිමිවි තිබුණත් සැබැවින්ම සත්‍ය විධායකය පැවතියේ මෙකී රාජ්‍ය නිලධාරීන් මතය. මේ හිමිවූ විධායක බලතල මත දේශිය නියෝජිතයින් විසින් ගෙන එන්නාවූ පණත් මේ නිලධාරීන් විසින් නිෂ්ප්‍රභ කිරීමටත් පමා

කිරීම්වලටත් ලක්විය. ඔවුන් අධිරාජ්‍යය සුරකින මුර බල්ලන් සේ ක්‍රියාත්මක විය. එසේම ආණ්ඩුකාරයාගේ අනුමැතිය අවශ්‍ය වූ අවස්ථාවලදී ඔහුගේත් බලපෑමට ලක්විය. එම නිලධාරින්ගේ බලයද ඉහළ අගයක් ගත්තේය. රාජ්‍ය නිළධාන් නිසා තවදුරටත් මෙරට තුළ අධිරාජ්‍යවාදී බව ආරක්ෂා විය. කෙසේ නමුත් තව දුරටත් වැඩි පාලන බලයක් ඉල්ලමින් කළ උද්සෝෂණ ව්‍යාපාර හෙවත් නිදහස දිනා ගැනීම සඳහා වු උද්සෝෂණ ව්‍යාපාර මෙම ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වන කාලයේදී පැවතියේ නැත.

එමෙන්ම මේ ආණ්ඩුක්‍රමයේ පැවති දුර්වලතා දිගින් දිගටම ඇමති මණ්ඩලය විසින් පෙන්වා දෙන ලද අතර නව ආණ්ඩුක්‍රමයක් ඉල්ලා සිටියේය. 1943 ප්‍රකාශනයට අනුව ඇමති මණ්ඩලය විසින් නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මාලාවක් කෙටුම්පත් කළ අතර (1944 දී) එහි අඩංගු වූ ප්‍රධාන යෝජනා වූයේ

- පාර්ලිමේන්තුව රජු සහ රාජ්‍ය මන්ත්‍රණ සභාවකින් සමන්විත වීම.
- අවශ්‍ය වුවහොත් සෙනෙට් මණ්ඩලයක් ඇති කිරිම.
- ප්‍රාථමික ඇමති මණ්ඩලය සභිකයන් 100 කින් සමන්විත වීම හා ඉන් 95 දෙනෙක් ඡන්දයෙන් තේරීම.
- ව්‍යවස්ථාදායකයේ කාලය වර්ෂ 5 ක් වීම.
- විධායක කාරක සභා ක්‍රමය අහෝසි කර කැබිනට් මණ්ඩලයක් පිහිටුවීම.
- රාජ්‍ය හා අධිකරණ සේවා කොමිසන් සභා පිහිටුවිම. (පෙරේරා,1965,පි. 43)

නමුත් මේ අවස්ථාවේදී බ්‍රිතාන්‍ය රජය මේ වන විටදී දෙවන ලෝක යුද්ධයට මැදිහත් වී සිටි හෙයින් එය සිදු කළ නොහැකි බවත් පවතින ආණ්ඩුක්‍රමය තවත් වර්ෂ දෙකක් දිගු කළ යුතු බවත් දන්වා සිටියේය. ආණ්ඩුව කියා සිටියේ යුද්ධයෙන් පසුව වැඩි බලතල සහිත ආණ්ඩුක්‍රමයක් ලබා දෙන බවත් මේ අවස්ථාවේ තම මව් රටට සහාය ලබා දෙන ලෙසත්ය.

නමුත් වර්ෂ 1944 ප්‍රකාශනය පරිදි ලංකාවේ ප්‍රතිසංස්කරණ ගැන සොයා බලා නව යෝජනා ඉදිරිපත් කිරීමට සෝල්බරි සාමි ප්‍රමුඛ වූ ජේ.එෆ් රීස් හා එෆ්.ජේ බරෝස් අයගෙන් යුත් කමිටුවක් මෙරටට පැමිණ බොහෝ දෙනාගේ අදහස් විමසා බලා සිය යෝජනා ඉදිරිපත් කරන ලදී. මෙම යෝජනා ඉදිරිපත් කරන ලද්දේ 1943 ප්‍රකාශනයට අනුව බවත් මේ නව යෝජනා පරිදි ලංකාවට පූර්ණ ස්වරාජ්‍ය නිදහස් බව ලබා ගත හැකි බවත් ඒ කොමිසම විසින් පෙන්වා දෙන ලදී. ලාංකිකයන්ගේ අරමුණ වූ ඩොමීනියන් තත්ත්වය එක්වරම ලඟා කර ගැනීම අපහසු බවත් තම යෝජනා හා එම අරමුණ අතර ඇත්තේ සුළු වෙනසක් බවත් කොමිසම පෙන්වා දෙන ලදී. පසුව මේ පිළිබඳ සාකච්ඡා කිරීමට ඩී.ඇස් සේනානායක මහතා බ්‍රිතාන්‍යට කැඳවු අතර මේ වන විටදි දෙවන ලෝක යුද්ධයද අවසන් වී කම්කරු පක්ෂයක් බලයට පැමිණ සිටියේය. මේ පක්ෂය හමුවේ ඔහු පැවසුවේ තම රටේ අභිප්‍රාය වූ ඩොමීනියන් තත්ත්වය බවයි. පසුව උක්ත කී සෝල්බරි කොමිසමේ යෝජනා පරිදි ලංකාවට සුදුසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කළ අතර 1946 මැයි මසදි එය රාජාඥාවක් මඟින් සම්මත විය. (පෙරේරා,1965,පි. 46) මෙහි වගන්ති 92 ක් වු අතර කොටස් නවයකින් යුක්ත විය. මේ අනුව නව ව්‍යවස්ථාදායක සභාව පිහිටවිය යුතු වු හෙයින් ඒ සඳහා නව ඇමති

මණ්ඩලයක් පත් කළ යුතු විය. ඒ සඳහා මැතිවරණය 1947 දී පවත්වන ලදී මෙහිදි ඩී.එස් සේනානායක මහතාගේ නායකත්වයෙන් යුත් එක්සත් ජාතික පක්ෂය ආසන 95 න් 42 ජයගත් අතර අගමැති ලෙසින් හෙතෙමම පත්විය.

මේ නව ව්‍යවස්ථාව මගින් ඩොමීනියන් තත්ත්වයද ලැබුණ අතර බ්‍රිතාන්‍ය ආණ්ඩුව විසින් සම්මත කර එවන ලද ලංකා නිදහස් ආණ්ඩුක්‍රම පනත 1948 පෙබරවාරි 04 දා සිට ක්‍රියාත්මක විය. එදා පටන් ලංකාව නිදහස් රාජ්‍යයක් ලෙසින් ක්‍රියාත්මක විය. යටත් විජිත බවින් නිදහස් විය. නමුත් අධිරාජ්‍යවාදි බැමිවලින් පරිපූර්ණ ලෙසින් ම නිදහස් වුයේ නැත.

මේ ආකාරයට සියවස් දෙකක් තිස්සේ නිදහස සඳහා කෙරුණු අරගල නිමාවට පත් කරමින් නිදහස් සටන් ව්‍යාපාරය අවසන් වූ අතර මේ සඳහා විසිවන සියවසේ සිට ගෙන ගියාවූ මධ්‍යස්ථවාදීව නිදහස දිනා ගැනීම සඳහා වු ව්‍යාපාරය (ව්‍යවස්ථාදායි ක්‍රියාමාර්ග) මහත් දායකත්වයක් සපයන ලද බව නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ජයවර්ධන, කුමාරි (2004), *ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම*, සංජීව ප්‍රකාශන, කොළඹ.

ද සිල්වා, එම්.යූ. (1996), *ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශය හා ජාතික ව්‍යාපාරය*, කර්තෘ ප්‍රකාශන.

පෙරේරා, ඇන්.ඇම්. (1960) *ආණ්ඩු පරිණාමය*, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

පෙරේරා, බී.සී. (1965), *ලංකාවේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය*, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ.

බණ්ඩාර, නවරත්න (2007), *බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය*, සුරස ප්‍රකාශන, කොළඹ.